සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

| 6 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 62 S I,II |
|---|---|---|
| නම: ............................................ | පුරවැසි අධ්‍යාපනය | කාලය පැය දෙකයි |

**★ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
**★ මෙම කොටසට එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ලකුණු 40 ක් හිමි වේ.**
**★ ප්‍රශ්න අංක 1 - 5 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.**

01) පාසල ආරම්භ වූ දා සිට මේ දක්වා විකාශනය වූ ආකාරය පිළිබඳ තොරතුරු ........................................................ ලෙස හැඳින්වේ.

02) නිදහස් අධ්‍යාපනයේ පියා ලෙස හඳුන්වන්නේ .................................................... මහතා ය.

03) කාර්යක්ෂමව කටයුතු කිරීම අපට සේවා සපයන ආයතනවල .................................................. වේ.

04) රාජ්‍ය ඔසුසල නිර්මාතෘ වන්නේ ..................................................... මහතා ය.

05) පාසල් අධ්‍යාපන කටයුතු කරගෙන යාමට අවශ්‍ය අවම පහසුකම් ලැබීම ඔබ සතු ......................................... වේ.

(සේනක බිබිලේ, පාසල් ඉතිහාසය, අයිතිවාසිකමක්, යුතුකමක්, සී.ඩබ්.ඩබ්. කන්නන්ගර)

**★ ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ හරි නම් (✔) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06) ස්වභාවධර්මයේ දායාද භාවිත කරමින් මිනිසා විසින් නිර්මාණය කළ දෑ නිර්මිත සම්පත් නම් වේ. ( )

07) ලොග් සටහන් පොත, පාසලේ ඓතිහාසික තොරතුරු සොයාගත හැකි මූලාශ්‍රයක් නොවේ. ( )

08) උප්පැන්න සහතික නිකුත් කරන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගිනි. ( )

09) පාසලේ පවත්නා සම්ප්‍රදායන් පාසල් සංස්කෘතියට අයත් නොවේ. ( )

10) ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතන වර්ග 03 ක් දක්නට ලැබේ. ( )

**★ ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

11) අප රටේ පරිපාලන බෙදීම් අනුව කුඩාම පරිපාලන ඒකකය වන්නේ,
1. ගමයි
2. ග්‍රාම නිලධාරී කොට්ඨාසය යි
3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය යි
4. දිස්ත්‍රික්කය යි

12) පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන සංකේතයක් නොවන්නේ,
1. පාසල් ලාංඡනය යි.
2. පාසල් කොඩිය යි.
3. ජාතික කොඩිය යි.
4. මෙහෙවර ප්‍රකාශය යි.

13) උතුරු පළාතට අයත් නොවන දිස්ත්‍රික්කය වන්නේ,
1. යාපනය යි.
2. මොණරාගල යි.
3. මුලතිව් යි.
4. මන්නාරම යි.

14) ජීව දත්ත තොරතුරු පත්‍රිකාවක අන්තර්ගත නොවන්නේ,
1. සම්පූර්ණ නම යි.
2. උපන් දිනය යි.
3. පෞද්ගලික ලිපිනය යි.
4. ස්කන්ධ දර්ශකය (බර) යි.



LIVEWORKSHEETS

15) පාසලේ පාලනයට සම්බන්ධ ප්‍රධාන තනතුර වන්නේ,

1. නියෝජ්‍ය විදුහල්පති ය.
2. අංශ ප්‍රධාන ය.
3. විදුහල්පති ය.
4. ප්‍රධාන ශිෂ්‍ය නායක ය.

**★ ප්‍රශ්න අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට දී ඇති පින්තූර ඇසුරෙන් පිළිතුරු ලියන්න.**



16) A පින්තූරයෙන් දැක්වෙන ප්‍රතිමාව හඳුන්වන නම කුමක් ද?
..............................................

17) එම ප්‍රතිමාව පිහිටි දිස්ත්‍රික්කය කුමක් ද? ......................................



18) B පින්තූරයෙන් දැක්වෙන්නේ .................................................. යි.

19) එය පිහිටන්නේ පියගැට පෙළක ...................................... පඩිය ලෙසයි.

20) දේශීය සංස්කෘතිය තුළ දක්නට ලැබෙන පහත ආගම ඇසුරෙන් පැවැත්වෙන උත්සව 04 ක් ලියන්න.

1. බෞද්ධ ආගම : ..............................................
1. කතෝලික ආගම : ..............................................
2. ඉස්ලාම් ආගම : ..............................................
3. හින්දු ආගම : ..............................................



LIVEWORKSHEETS